## උඩපළාත ප්‍රාදේශීය සභාව
## 2023.08.29 දින ටෙන්ඩර් මණ්ඩල වාර්තාව

- **තීරණ අංක 01**

මාර්ග කම්කරුවන් සඳහා අවශ්‍ය ආරක්ෂිත තොප්පි සහ ජැකට් මිලදී ගැනීමට මිල කැඳවන ලදි. ඒ සඳහා ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අං: | විස්තරය | පේපර්ලයින් පුද්. සමාගම | අජන්ත වූල්ස් | ක්ලික් ට්‍රේඩින් කම්පැනි |
|---|---|---|---|---|
| 01 | කහ වර්ණ ලුමිනස් පටි යෙදූ අත් රහිත ජැකට් | 2012.50 | 2000.00 | 2500.00 |
| 02 | ලා කොළ වර්ණ ලුමිනස් පටි යෙදූ අත් රහිත ජැකට්<br>පිටුපස "උඩපළාත ප්‍රාදේශීය සභාව හෝ U P S'' ලෙස (Print) සඳහන් කළ යුතු ය. | 2012.50 | 2000.00 | 2500.00 |
| 03 | හිස් ආවරණය සහිත ආරක්ෂිත හෙල්මට් (කහ වර්ණය) | 511.75 | 850.00 | 1100.00 |

ලද මිල ගණන් පරික්ෂා කිරීමේදී ආයතනවලින් භාණ්ඩ පිළිබඳව වර්ගයක් (Brand) හෝ විස්තරයක් දක්වා නොමැති බැවින් සාම්පල් පරික්ෂා කොට බලා අනතුරුව කල් පවතින, ප්‍රමිතියෙන් උසස් තත්වයේ භාණ්ඩ තෝරා මිලදී ගැනීම වඩා සුදුසු බව ට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 02**

සභා බල ප්‍රදේශයේ පදිංචි ගර්භණී මවුවරුන් සඳහා පෝෂණ මල්ලක් ලබා දීමට අවශ්‍ය බැවින් ඊට ඇතුලත් වියළි ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ප්‍රදේශයේ ආයතන 03කින් මිල ගණන් කැඳවූ නමුත් ඒ සඳහා එක් ආයතනයකින් පමණක් මිල ගණන් ලැබී තිබුණි. එම මිල ගණන් පහත දැක්වේ.

| අනු අං: | විස්තරය | අරලිය සුපර් සිටි |
|---|---|---|
| 01 | නාඩු සහල් 5kg | (අරලිය/නිපුන)1090.00<br>(සූර්යා)1015.00 (වීහේන) 950.00 |
| 02 | කඩල 500g | 330.00 |
| 03 | කව්පි 500g | (රතු) 550.00 (සුදු) 500.00 |
| 04 | මුං ඇට 500g | 510.00 |
| 05 | හාල් මැස්සෝ 500g | 525.00 |

මේ සඳහා එක් ආයතනයකින් පමණක් මිල ගණන් ලබා දී ඇති බැවින්, ප්‍රදේශයේ තවත් සැපයුම් ආයතන දෙකකින් හෝ රජයේ ආයතනයක් වන සතොස ආයතනයකින් හෝ මිල ගණන් ලබාගෙන මිල සැසඳීමක් කොට සුදුසු ආයතනයකින් ද්‍රව්‍ය මිලදී ගැනීම වඩා සුදුසු බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 03**

මාර්ග කම්කරුවන් සේවය කිරීමේදී ආරක්ෂාවට අවශ්‍ය පුවරු මිලදී ගැනීමට සභාවේ ලියාපදිංචි සැපයුම් ආයතනයන්ගෙන් මිල ගණන් කැඳවන ලදි. මේ සඳහා ආයතන දෙකකින් පමණක් මිල ගණන් ලැබී ඇත.

| අනු අං | විස්තරය | තරිඳු ඩිජිටල් ප්‍රින්ටින් | තිළිණ ප්‍රින්ටර්ස් |
|---|---|---|---|
| 01 | “ මාර්ග කම්කරුවන් ඉදිරියෙන් වැඩ වාහන සෙමින් පදවන්න.”<br><br>ලෙස පුවරු සකස් කිරීම | 9580.00 | 12000.00 |

ලද මිල ගණන් අනුව අවම මිලට තරිඳු ඩිජිටල් ප්‍රින්ටින් ආයතනයෙන් පුවරු 01ක් රු. 9580.00 බැගින් සකස් කරවා ගැනීම වඩා සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 04**

මාර්ග කම්කරුවන්ට අවශ්‍ය විල්බැරෝ සහ කෝන් මිලට ගැනීමට සභාවේ ලියාපදිංචි ආයතන වලින් මිල ගණන් කැඳවන ලදි. එම මිල ගණන් පහතින් දැක්වේ.

| අ අ | විස්තරය | අජන්ත ටූල්ස් | ජයලංකා හාඩ්වෙයාර් | මහනුවර ඒජන්සි | උපුල් හාඩ්වෙයාර් | සල්මල් ට්‍රේඩින් | ලලන්ස් ස්පෝට් |
|---|---|---|---|---|---|---|---|
| 01 | කෝන්<br>මාර්ග කම්කරුවන් සඳහා | 4300.00 | 3950.00 | 4500.00 | 5700.00<br>(ෆයිබර්/ රබර්)<br>5100.00<br>(ප්ලාස්ටික්) | 5500.00<br>(ප්ලාස්ටික්) | 9750.00<br>(ෆයිබර්/ රබර්) |
| 02 | විල්බැරෝ | 11000.00 | 6500.00 | 8000.00 | --- | 10500.00 | --- |

ලද මිල ගණන් පරික්ෂා කර බැලීමේදී එක් එක් ආයතනවලින් නොයෙකුත් වර්ග සඳහා නොයෙක් මිල ගණන්ද දක්නට ඇති බැවින් කෝන් සම්බන්ධව උස, පළල සහ නිෂ්පාදිත ද්‍රව්‍ය පිළිබඳව විමසා බලා පසුව අයිතම 02 සඳහාම තාක්ෂණ කමිටු වාර්තාවක් ලබා ගෙන අදාළ මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බවට ටෙනඩර් මණ්ඩලයේ තීරණය විය.

- **තීරණ අංක 05**

ආඩියාකඩවත සහ ඩම්පර් හන්දිය යන ස්ථානවල ත්‍රී රෝද රථ පුවරු සවිකිරීම සම්බන්ධයෙන් සභාවේ ලියාපදිංචි සැපයුම් ආයතනවලින් මිල කැඳවන ලදි. ඒ සඳහා ලද මිල ගණන් පහත දැක්වේ.

| අ.අ | විස්තරය | තරිඳු ඩිජිටල් ප්‍රින්ටින් | තිළිණ ප්‍රින්ටර්ස් |
|---|---|---|---|
| 01 | දැනට සවි කොට ඇති ත්‍රී රෝද රථ පුවරුවට පහතින් ත්‍රී රෝද රථ අංක සහිත පුවරුව සවි කිරීම. | 8880.00 | 8000.00 |

මෙම මිල ගණන් අනුව, අවම මිල යටතේ තිළිණ ප්‍රින්ටර්ස් ආයතනයෙන් ත්‍රී රෝද රථ පුවරු 01ක් රු.8000.00 ක මිලට සකස් කර ගැනීම වඩා සුදුසු බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 06**

සභාව සතු LL-7586 ලොරි රථයට ටයර් යෙදීම සඳහා මිල ගණන් කැඳවන ලද අතර ඒ සඳහා ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අං | විස්තරය | M.J.R. පීරිස් සහ සමාගම | ක්‍රවුන් ටයර්ස් | පෙරේරා ටයර්ස් | සුපිරි ටයර් හවුස් |
|---|---|---|---|---|---|
| 01 | 650 / 16 LT ප්‍රමාණයේ ටයර් | 33695.00 (CEAT) | 31395.00 (CEAT) | 34147.00 (CEAT) | 32545.00 (CEAT) |

මිල ගණන් පරීක්ෂා කිරීමේදී එකම වර්ගයකින් ටයර්වල මිල දක්වා ඇති බැවින් අවම මිල ගණන් යටතේ ටයර් මිලට ගැනීම සුදුසු වන අතර, ඒ අනුව ක්‍රවුන් ටයර්ස් ආයතනයේ ටයර් මිල අවම වූවත්, එය කොළඹ පිහිටි ආයතනයක් වීම මත ප්‍රවාහන වියදම් සලකා බලා සහ ඉන් පසුව සඳහන් මිල සුළු ප්‍රමාණයකින් වැඩි වීම සහ ටයර් මාරු කිරීමේදී සමබරතාව (Wheel alignment) පරීක්ෂා කරවා ගත යුතු බැවින් සුපිරි ටයර් හවුස් ආයතනයෙන් ටයර් 01ක් රු.32545.00 බැගින් මිලදී ගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 07**

පුස්සැල්ලාව උප කාර්යාලයට අවශ්‍ය බිම ආලේප කිරීමට තීන්ත මිලදී ගැනීමට මිල ගණන් කැඳවන ලදි. ආයතන 02 කින් මිල ගණන් ලබා දී තිබූ අතර එම මිල ගණන් පහත දැක්වේ.

| අනු අං | විස්තරය | ජයලංකා හාඩ්වෙයාර් | ප්‍රනාන්දු හාඩ්වෙයාර් |
|---|---|---|---|
| 01 | ෆ්ලෝ පේන්ට් | 2100.00 (මල්ටිලැක්) | 2550.00 (කලර් මැක්ස්) |
| 02 | තිනර් | 650.00 | 650.00 |

මිල ගණන් විමසා බැලීමේදී මල්ටිලැක් වර්ගය ප්‍රමිතියෙන් උසස් වන බැවින් සහ එය අවම මිලකට ලබා දිය හැකි බව දක්වා ඇති බැවින් ජයලංකා හාඩ්වෙයාර් ආයතනයෙන් ෆ්ලෝ පේන්ට් ලීටරයක් රු.2100.00 ටත්, තිනර් එම ආයතනයෙන්ම රු.650.00 ක මිලටත් මිලදී ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 08**

සභා අරමුදල් යටතේ අඩු ආදායම්ලාභී දරුවන් තුන් දෙනෙක් සඳහා පොත් කට්ටල 03ක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවන ලදි. ඒ සඳහා ලද මිල ගණන් පහත දැක්වේ.

| අනු අං | විස්තරය | L.H. චන්ද්‍රසේකර සහ සමාගම | සෙන්ට්‍රල් ස්ටේෂනරිස් | නිව් ජෙනරල් | පේපර්ලයින් ට්‍රේඩින් |
|---|---|---|---|---|---|
| 01 | තනිරූල් පොත් පිටු-120 | 134.66 | 135.00 | 121.50 | 112.49 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 02 | කොටුරුල් පොත් පිටු - 120 | 134.66 | 135.00 | 121.50 | 112.49 |
| 03 | CR තනිරුල් පොත් පිටු-120 | 222.14 | 262.50 | 232.51 | 232.50 |
| 04 | CR කොටුරුල් පොත් පිටු-120 | 222.14 | 232.50 | 243.00 | 232.50 |
| 05 | අඟලේ තනිරුල් පොත් පිටු-80 | 89.77 | 90.00 | 82.00 | 86.25 |
| 06 | අඟලේ කොටුරුල් පොත් පිටු-80 | 89.77 | 75.00 | 82.00 | 86.25 |
| 07 | පස් රුල් පොත් පිටු -80 | 89.77 | 90.00 | 82.00 | 86.25 |
| 08 | B5 පොත් පිටු-160 | 231.91 | 368.00 | ---- | 255.30 |
| 09 | සුදු ඩ්‍රෝවින් පොත් පිටු-80 | 209.47 | 210.00 | 195.00 | 204.70 |
| 10 | කලු ඩ්‍රෝවින් පොත් පිටු-80 | 145.5 | 245.00 | 215.00 | 184.00 |
| 11 | රුල් රහිත කොපි පොත් පිටු-80 | 74.81 | 90.00 | 77.67 | 86.25 |
| 12 | කවකටු පෙට්ටි | 325.5 | 325.00 | 334.00 | 292.10 |
| 13 | පාට පැස්ටල් පෙට්ටි - පාට12 | 160.41 | 157.50 | 162.00 | 159.85 |
| 14 | පාට පැන්සල් පෙට්ටි - පාට12 | 397.21 | 416.00 | 417.00 | 292.10 |
| 15 | ඉරේසර් - මධ්‍යම ප්‍රමාණ | 19.09 | 10.00 | 22.00 | 10.81 |
| 16 | කටර් | 30.55 | 7.50 | 25.00 | 17.25 |
| 17 | පැන්සල් | 29.14 | 19.50 | 14.00 | 21.56 |
| 18 | පෑන් - නිල් | 15.50 | 18.50 | 47.25 | 14.95 |
| | කලු | 15.50 | 18.50 | 47.25 | 14.95 |
| | වෙනත් වර්ණ 6කින් | 19.09 | 115.00 | ---- | 20.07 |

ලද මිල ගණන් විමසා බැලීමේදී වැඩි වශයෙන් මිල ගණන් ලබා දී තිබෙනුයේ ඇට්ලස් නම් ප්‍රමිතියෙන් උසස් වර්ගය සඳහා වීම හේතුවෙන් එම වර්ගයෙන් අවම මිල ගණන් ලබා දී ඇති ආයතනයෙන් පොත් කට්ටලය මිලදී ගැනීම සුදුසු බවත්, යම් යම් අයිතමයන් සඳහා අවම මිල ගණන් ලබා දී ඇතත්, ඒ ඒ ආයතනයන්ගෙන් අයිතම එකක් හෝ දෙකක් මිලදි ගැනීමට වඩා සම්පූර්ණ පොත් කට්ටලයටම යන මිල ගණන් තක්සේරු කර අවම මිල ගණන් ඇති ආයතන එකකින් හෝ දෙකකින් ප්‍රමිතියෙන් යුතු ව පොත් කට්ටලයට අවශ්‍ය අයිතමයන් මිලදී ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

ඒ අනුව, ඇට්ලස් වර්ගය සඳහා අවම මිල ගණන් යටතේ තනිරුල් පොත් පිටු-120 සහ කොටුරුල් පොත් පිටු - 120 පොතක් රු.112.49 ට ත්, අඟලේ තනිරුල් පොත් පිටු-80, අඟලේ කොටුරුල් පොත් පිටු-80, පස් රුල් පොත් පිටු -80 රු. 86.25 ට ත්, සුදු ඩ්‍රෝවින් පොත් පිටු-80 රු.204.70 ට ත්, කවකටු පෙට්ටි 01ක් රු.292.10 ට ත්, ඉරේසර් 01ක් රු.10.81ට ත්, කටර් 01ක් රු.

17.25 ට ත්, පැන්සල් 01ක්, රු.21.56 ටත්, නිල් සහ කලු පෑන් 01ක් රු.14.95 ට ත්, පාට 06න් පෑන් 01ක් රු. 20.07 බැගින් ද, පෙන්ටියම් පැස්ටල් පෙට්ටි 01ක් රු. 159.85 ට ත් පේපර්ලයින් ආයතනයෙන් මිලදී ගැනීමට ත්,

ඇට්ලස් වර්ගයෙන් ම අවම මිලට CR තනිරූල් පොත් පිටු-120 සහ CR කොටුරූල් පොත් පිටු-120 එකක් රු. 222.14 ට ත්, B5 පොත් පිටු-160 රු. 231.91 ට ත්, කලු ඩ්‍රෝවින් පොත් පිටු-80 එකක් රු. 145.50 ට ත්, රූල් රහිත කොපි පොත් පිටු-80 එකක් රු. 74.81 ට ත්, පාට පැන්සල් පෙට්ටියක් රු. 397.21 ට ත් චන්ද්‍රසේකර ආයතනයෙන් ද මිලදී ගැනීම සුදුසු බවට තවදුරටත් ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 09**

කාර්යාලයට අවශ්‍ය ප්‍රොජෙක්ටරයක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවිය. සභාවේ ලියාපදිංචි සැපයුම් ආයතන සහ දේශීය නියෝජිත ආයතනයන්ගෙන් ද මිල කැඳවීය.

| අනු අං | විස්තරය | දිනපාල පුද්. සමාගම | බේස් එච් පී සමාගම | ඔෆිස් ෂොප් | ජෝන් කීල්ස් |
|---|---|---|---|---|---|
| 01 | ප්‍රොජෙක්ටරය | 199,500.00<br>VIVITEK – DX 273 | 196,000.00<br>VIVITEK – BW 572 | 301,500.00<br>OPTOMA W319ST | 235,000.00<br>VIEWSONIC – LS 550 WHE |

මිල ගණන් අනුව, නිෂ්පාදන වර්ග කිහිපයක් සඳහා මිල ගණන් කිහිපයක් දක්වා ඇති බැවින් සහ තවදුරටත් තත්වය පරික්ෂා කොට මිලදී ගත යුතු බැවින් ඉංජිනේරු වාර්තාවක් ලබා ගෙන මිලදී ගැනීම් කටයුතු ඒ අනුව සිදු කිරීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 10**

කාර්යාලයට අවශ්‍ය පරිගණක බැටරි (UPS) මිලදී ගැනීමට මිල ගණන් කැඳවිය. සභාවේ ලියාපදිංචි සැපයුම් ආයතනවලින් මිල කැඳවන ලද අතර එම මිල ගණන් පහත දැක්වේ.

| අනු අං | විස්තරය | පේපර්ලයින් ට්‍රේඩින් | L.H. චන්ද්‍රසේකර සහ සමාගම | ඔෆිස් ෂොප් | දිනපාල පුද්. සමාගම | ග්‍රීන් ලයින් |
|---|---|---|---|---|---|---|
| 01 | පරිගණක බැටරි (UPS) | 9250.00<br>SCP<br>(2 yr war) | 10090.00<br>DCP | 12750.00<br>DCP | 12600.00<br>PROLINK<br>(2 yr war) | 10100.00<br>SCP<br>(1 yr war) |

පරිගණක බැටරි (UPS) මිලදී ගැනීම සඳහා ද නිෂ්පාදන වර්ග කිහිපයක් සඳහා මිල ගණන් කිහිපයක් දක්වා ඇති බැවින් සහ තවදුරටත් තත්වය පරික්ෂා කොට මිලදී ගත යුතු බැවින් ඉංජිනේරු වාර්තාවක් ලබා ගෙන මිලදී ගැනීම් කටයුතු ඒ අනුව සිදු කිරීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 11**

කාර්යාලයට අවශ්‍ය පරිගණකයක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීය. සභාවේ ලියාපදිංචි සැපයුම් ආයතනවලින් සහ දේශීය නියෝජිත ආයතනයන්ගෙන් ද මිල කැඳවන ලද අතර එම මිල ගණන් පහත දැක්වේ.

| අනු අං | විස්තරය | පේපර්ලයින් ට්‍රේඩින් | ඔෆිස් ෂොප් |
|---|---|---|---|
| 01 | පරිගණකයක් මිලදී ගැනීම | 198,000.00<br>ASUS | 247,800.00<br>Dell Vostro 3020 |

පරිගණයක් මිලදී ගැනීම සඳහා කැඳවූ මිල ගණන් සඳහා ආයතන 2කින් පමණක් මිල ගණන් ලද අතර එම මිල ගණන් සම්බන්ධව ඉංජිනේරු වාර්තාවක් ලබා ගෙන මිලදී ගැනීම් කටයුතු සිදු කිරීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 12**

කාර්යාලයේ භාවිතය සඳහා අවශ්‍ය ජල ටැංකියක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීය. එම මිල ගණන් පහත දැක්වේ.

| අනු අං | විස්තරය | උපුල් හාඩ්වෙයාර් | මහනුවර ඒජන්සි | ජයලංකා හාඩ්වෙයාර් | වෙලගෙදර ට්‍රේඩර්ස් |
|---|---|---|---|---|---|
| 01 | ජල ටැංකිය<br>2000 ලීටර් | 40500.00<br>(ANTON MAX)<br>40000.00<br>(ARPICO)<br>40900.00<br>(PE +) 10 yr warr | 38900.00<br>(PE +) 10 yr warr | 35000.00<br>(ANTON )<br>10 yr warr | 37000.00<br>(ANTON ) |

ලද මිල ගණන් තාක්ෂණ කමිටුවක් වෙත ඉදිරිපත් කර වාර්තාවක් ලබා ගත් පසුව, ඒ අනුව මිලදී ගැනීම් කටයුතු සිදු කිරීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

| අනු අං: | විස්තරය | ඉන්ද්‍රා ට්‍රේඩර්ස් |
|---|---|---|
| 01 | LL 7364 ජල බවුසරයේ ඉදිරිපස අසුන් එනම්, රියදුරු ආසනය සහ රියදුරු සහයක අසුන් සඳහා ශීට් කවර අලුතින්ම යෙදීම<br>➢ අවශ්‍ය තැන් සඳහා කුෂන් පිරවීමක් සිදු කළ යුතු ය. | 45000.00 |

- **තීරණ අංක 13**

කාර්යාලයේ LL-7364 ජල බවුසරයේ ආසන අලුත්වැඩියා කිරීම සඳහා සභාවේ ලියාපදිංචි සහ ප්‍රදේශයේ සේවා සපයන්නන්ගෙන් මිල ගණන් කැඳවන ලදි. එනමුත්, එක් ආයතනයකින් පමණක් මේ සඳහා මිල ගණන් ලැබී තිබුණි.

මෙම මිල ගණන් අනුව එක් ආයතනයකින් පමණක් මිල ගණන් ලබා දී ඇති ඇති බැවින් නැවත මිල කැඳවීම ඉතා සුදුසු බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 14**

කාර්යාලය සඳහා අවශ්‍ය මුද්‍රිත ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීමට සභාවේ ලියාපදිංචි සැපයුම් ආයතනවලින් මිල කැඳවන ලදි. ඒ සඳහා ලද මිල ගණන් පහත දැක්වේ.

| අ.අ | විස්තරය | තරිඳු ඩිජිටල් ප්‍රින්ටින් | තිළිණ ප්‍රින්ටර්ස් | කේ.සී. ක්‍රියේෂන්ස් | ලංකා ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | ප්‍රා.ස 01පොත් | 361.00 | 400.00 | 430.00 | 365.00 |
| 02 | තාවකාලික ලදු පොත් | 250.00 | 255.00 | 280.00 | 278.00 |

මෙම මිල ගණන් අනුව, අවම මිල යටතේ සහ මුද්‍රණ කටයුතු සම්බන්ධව ප්‍රදේශයේ ප්‍රමුඛත්වයක් දක්වන ආයතනයක් වන බැවින් තරිඳු ඩිජිටල් ප්‍රින්ටින් ආයතනයෙන් ප්‍රා.ස 01පොතක් රු.361.00 ට ත්, තාවකාලික ලදු පොත් 01ක් රු.250.00 ට ත් සකස් කර ගැනීම වඩා සුදුසු බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 15**

කාර්යාලයට අවශ්‍ය ජල පෙරණයක් (Water Filter) එකක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලදි. නමුත්, එක් ආයතනයකින් පමණක් මේ සඳහා මිල ගණන් ලැබී ඇත.

| අනු අං | විස්තරය | මහනුවර ඒජන්සි |
|---|---|---|
| 01 | **ජල පෙරනයක් (Water Filter) මිලදී ගැනීම**<br>**(රූපයේ සඳහන් පරිදි ලීටර් 5ක ජල ධාරිතාවකින් යුතු බෝතලයක් රැඳවිය හැකි ජල පෙරනයකි)** | 23000.00<br>AQUA – CHINA<br>(6 mnth warranty) |

මේ සඳහා එක් ආයතනයකින් පමණක් මිල ගණන් ලැබී ඇති බැවින්, සිංගර්, දිනපාල, අබාන්ස් වැනි ආයතනද ඇතුළත්ව නැවත මිල කැඳවීම වඩා සුදුසු බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 16**

පුරවැසි ප්‍රඥප්තිය පුවරුවක් ලෙස සකසා කාර්යාලයේ ප්‍රදර්ශනය කිරීම සඳහා මිල ගණන් කැඳවන ලදි. මේ සඳහා ලද මිල ගණන් පහත දක්වා ඇත.

| අ.අ | විස්තරය | තිළිණ ප්‍රින්ටර්ස් | තරිඳු ඩිජිටල් ප්‍රින්ටර්ස් |
|---|---|---|---|
| 01 | **12*8 ප්‍රමාණයේ, 3/4 * 3/4 බොක්ස් අයන් වලින් වට රාමුව සකසා, 24 ගේජ් GI බට යොදා සුදුසු පරිදි වහලයක් ද සකස් කොට නිම කිරීම (සිංහල සහ දෙමළ බසින්)** | 62000.00 | 59800.00 |
| 02 | **12*8 ප්‍රමාණයේ, 3/4 * 3/4 බොක්ස් අයන් වලින් වට රාමුව සකසා, 24 ගේජ් GI බට යොදා නිම කිරීම (සිංහල බසින්)** | 28000.00 | 25500.00 |

මෙම මිල ගණන් අනුව, අවම මිලට සිංහල සහ දෙමළ බසින් පුරවැසි ප්‍රඥප්තිය පුවරුවක් තරිඳු ඩිජිටල් ප්‍රින්ටින් ආයතනයෙන් රු.59800.00 ට සකස් කර ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

- **තීරණ අංක 17**

කාර්යාලයේ රුස්වීම් ශාලාවට තිර රෙදි යෙදීම සඳහා සභාවේ ලියාපදිංචි ආයතන නොමැති බැවින් ප්‍රදේශයේ සේවා සපයන ආයතනවලින් මිල ගණන් කැඳවන ලදි. මේ සඳහා ලද මිල ගණන් පහත දක්වා ඇත.

| අ.අ | විස්තරය | බන්දුල ටේලර්ස් | C I B | සමනල ටේලර්ස් |
|---|---|---|---|---|
| 01 | කාර්යාලයේ රුස්වීම් ශාලාවට තිර රෙදි යෙදීම | 195810.00 | 167370.00 | 202335.00 |

මෙම මිල ගණන් අනුව, අවම මිල ගණන් යටතේ මෙන්ම ප්‍රදේශයේ ඇගලුම් සහ තිර රෙදි සවි කිරීමේ ප්‍රමුඛයින් සේ සැලකෙන දේශීය නිෂ්පාදිත ආයතනයක් වන C I B ආයතනයෙන් අවම මිලට එනම්, රු. 167370.00 ක මුදලකට තිර රෙදි සවි කර ගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

<u>ටෙන්ඩර් මණ්ඩලය</u>

01. එස්. සුබසිංහ මිය - ලේකම්, උඩපළාත ප්‍රාදේශීය සභාව
02. පී.ජී.සී. කුමාරි මිය - ගණකාධිකාරී, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
03. පී.ජී.එස්. ජයතිලක මයා - තාක්ෂණ නිලධාරී, උඩපළාත ප්‍රාදේශීය සභාව
04. ජී.ආර්.වී.එල්.මැණිකේ මිය - ප්‍ර.කළ.සේ.නි, උඩපළාත ප්‍රාදේශීය සභාව
05. ලක්මාලි ගමගේ මිය - කළ.සේ.නි, උඩපළාත ප්‍රාදේශීය සභාව
06. දර්ශන උඩුගමසූරිය - සංවර්ධන නිලධාරි
07. ඩබ්.එන්. පොඩිමැණිකේ මිය - සංවර්ධන නිලධාරි

සකස් කළේ: ...…………........……………

පරීක්ෂා කළේ: ……………………………....

ලේකම්: .......................................